CRI 中国国际广播电台 CHINA RADIO INTERNATIONAL
CIBN 中国国际广播电视网络台 CHINA INTERNATIONAL BROADCASTING NETWORK

友谊之桥

සු භා ස ර

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ජාත්‍යන්තර සංචාරක දූපතක් වන හයිනැන් පළාත පිළිබඳ ප්‍රශ්නෝත්තර තරගය

සංචාරක මාර්ගෝපදේශක චීන භාෂා පාඨමාලාව

අපි දැන් 97.9 FM නවතම තරංග මාලාවෙන් හැමදාමත් ඔබ සමග!



中国国际广播电台僧伽罗语广播部
SINHALA SERVICE CHINA RADIO INTERNATIONAL

2012年第3期(总第25期)
2012 තුන්වන කලාපය

සුපිරි චීන සවාරියක් නොමිලේ දිනන්න

චීනයේ බෙයිජිං නුවර චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ හැවිලොක්වටුන් ලුම්බිණී කොන්ෆියුසියස් මධ්‍යස්ථානය විසින් සංවිධාන කරනු ලබන

හයිනැන් ප්‍රශ්නොත්තර තරගයේ

පිළිතුරු පත්‍රිකාව මේ සමග වෙයි.

මෙහි ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඔබගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ විද්‍යුත් ලිපිනය ද ලියා මෙහි සිටින අප නියෝජිතයාට භාර දෙන්න.

එසේ නැත්නම් පහත සඳහන් ලිපින වලින් එකකට එවන්න.

කොළඹ ලිපිනය	**ලුම්බිණී කොන්ෆියුසියස් මධ්‍යස්ථානය** **තැ. පෙ. 1774 කොළඹ**
විද්‍යුත් ලිපිනය	sinhalaservice@gmail.com
චීන ලිපිනය	Sinhala Service, China Radio International, 16A,Shijingshan Road BeiJing, P.R.China 100040

මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන්

ඔබට අංග සම්පූර්ණ සුපිරි චීන සංචාරයක් නොමිලයේම දිනාගත හැකිවෙයි.

මීට අමතරව තවත් වටිනා තෑගි රැසක්.

තරගයේ අවසන් දිනය නොවැම්බර් 30දා

වැඩි විස්තර සඳහා දිනපතා අහන්න.

FM බස්නාහිර	**FM 97.9**	උදේ 11: 30-13: 30 සවස 05: 30-07: 30
කෙටි තරංග	49.18 31.6 30.61 25.21	උදේ 05: 30-06: 30 සවස 07: 30-08: 30
website	http://sinhalese.cri.cn	

මේ අනාගි අවස්ථාව ඔබේ මිතුරන්ටත් ලබා දෙන්න.

දුරකථන 0112589747

Amarajeewa 0779213368 / Madushan0714532877 / Suramya 0726536661

ලුම්බිණී කොන්ෆියුසියස් මධ්‍යස්ථානය. ලුම්බිණී විද්‍යාලය, කොළඹ 5

ජාත්‍යන්තර සංචාරක දූපතක් වන හයිනැන් පළාත පිළිබඳ ප්‍රශ්නෝත්තර තරගය පිළිතුරු පත්‍රිකාව

නිවැරදි පිළිතුර ඉදිරියේ ඇති කොටුවේ √ ලකුණ යොදන්න

1. මෑත වසරවලදී, හයිනැන් පළාතේ සම්පත්වලින් උපරිම වාසිදායකත්වයක් ලබා ගැනීම සඳහා, හයිනැන් පළාත තුළ ප්‍රබල ලෙස ක්‍රියාත්මක වන සංවර්ධන උපාය මාර්ගය කුමක් ද?

① ජාත්‍යන්තර සංචාරක දූපත් සංවර්ධනය ☐

② හයිනැන් පළාතේ පාරිසරික සංවර්ධනය ☐

2. හයිනැන් පළාතේ තීරු බදු රහිත සාප්පු පිහිටා තිබෙන්නේ කවර නගර දෙකේ ද?

① ගුවන් චෝ නගරය සහ ශෙන්වන් නගරය ☐

② හයිකෝ නගරය සහ සන්යා නගරය ☐

3. චීන චිත්‍රපටයක් වන "If You Are The One 2" රූ ගත කෙරුණේ හයිනැන් පළාතේ කවර දර්ශනීය ස්ථානයකදී ද?

① යාලොන් බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය ☐

② සන්යා නාගරික උද්‍යානය ☐

4. යාලොන් බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය සැළසුම් කිරීමේ මූලධර්මය කුමක් ද?

① පෙර පරිසරයට හානි නොකිරීම ☐

② ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීම ☐

5. ලී ජාතික සාම්ප්‍රදායික සංස්කෘතියේදී, වැදගත් වන චාරිත්‍ර හා සම්බන්ධ ඔවුන්ගේ ජීවන ක්‍රමයේ සංකේතයක් ලෙස සැළකිය හැක්කේ කුමක් ද?

① බුලත් ☐

② ලිලි මල් ☐

6. හයිනැන් පළාතේ පුරාණතම පදිංචිකරුවන්, කවර ජාතියකට අයත් ද?

① හන් ජාතිය ☐

② ලී ජාතිය ☐

7. චීන රෙදිපිළි ඉතිහාසයේ ජීවමාන ෆොසිල වශයෙන් හැඳින්වෙන ලී ජාතික අත්කම් නිර්මාණය කුමක් ද?

① ලී ජාතික ගෙත්තම් කලාව ☐

② බයි ජාතික ගෙත්තම් කලාව ☐

8. හයිනැන් පළාතේ සුවිශේෂී ලක්ෂණ වලින් හෙබි සුළු ජාතීන් දෙක කුමක් ද?

① ලී ජාතිය සහ මියෞ ජාතිය ☐

② හුවෙයි ජාතිය සහ යී ජාතිය ☐

හයිනැන් පළාත

වර්ග කිලෝමීටර් 33900 කට අධික භූමි ප්‍රදේශයක් හිමි හයිනැන් පළාත, චීනයේ සොඳා අලංකාරය වර්ධනයට උර දෙන තවත් අපූරු දිවයිනකි. චීනයේ නැගෙනහිර සමුද්‍ර කොටසේ පටු සමුද්‍ර සන්ධියකින් වෙන්ව මේ මනරම් දිවයින පිහිටා තිබේ.

හයිනැන් පළාතේ පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැන්ම සඳහා මෑතකාලීනව සංවර්ධන ක්‍රම ගනණාවක් ක්‍රියාවට නංවා තිබේ. ඉන් ප්‍රධාන වනුයේ හයිනැන් දූපත "ජාත්‍යන්තර සංචාරක දූපතක්" ලෙස සංවර්ධනය කිරීමයි. මේ අනුව සංචාරක ආකර්ෂණය වෙනුවෙන් නව පියවර රැසක් ක්‍රියාත්මක කර තිබේ. "හයිකෝ සහ සන්යා" නගරවල පිහිටුවා ඇති තීරු බදු රහිත සාප්පු සංකීර්ණ ඉන් එක් පියවරකි.

දර්ශනීය භූමි ප්‍රදේශ අතින් මෙම දිවයින ඉතාමත් සරුසාරය. If you are the one II චිත්‍රපටය රූගත කල "යාලොන් බොක්කේ නිවර්තන වන උයන" ඒ අතරින් කැපී පෙනෙයි.

මෙම වන උද්‍යානය සැලසුම් කිරීමේදී චීන මධ්‍යම රජය සෑම විටම මුල්තැන දෙන එක් සුවිශේෂ ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කළේ ය. එම ප්‍රතිපත්තිය "පෙව පරිසරයට හානි නොකිරීමයි" මෙම දිවයිනේ චීන සුළු ජනවර්ග ගනණාවක් ජීවත් වෙති. ඒ අතරින් 'හන්' 'ලී' 'මියෑ' සහ චූආන්ග් ජන කොටස් ප්‍රධානය. 'ලී' ජාතිකයන්ගේ ජාත භූමිය හයිනැන් දිවයිනයි. 'ලී' ජාතික ජන සිරිත් අතර "බුලත් කොළය" කැපී පෙනේ. ඔවුන්ගේ චාරිත්‍ර චාරිත්‍ර අතර බුලතට විශේෂ තැනක් හිමිවෙයි. බුලත් සැපීම ද ඔවුන්ගේ පුරුද්දකි. ලී ජාතිකයෝ මෙම භූමියේ පැරණිතම පදිංචි කරුවෝ ය.

වේගවත්ව සංවර්ධනය වෙමින් පවතින හයිනැන් ජාත්‍යන්තර සංචාරක දූපත

ඔබ කැමති ද ඇත පෙනෙන ක්ෂතිජය දකිමින් සුන්දර පසැහිලි කන්ද පිස ගෙන සිසිල් සුළං විඳින්න. එහෙනම් මේ තොරතුරු ඔබට රසවත් වේවි.

චීනයේ දකුණෙන් ම පිහිටි හයිනැන් පලාත පෙරදිග හවායි දූපත ලෙස විරුදාවලි ලබා තිබෙනවා. එම දූපත චීනයේ විශාලත ම ආර්ථික විශේෂ කලාපය සහ එක ම උෂ්ණ කලාපීය දූපත වශයෙන් ද හඳුන්වනවා. යහපත් භූමි පිහිටීම, සුන්දර ස්වභාවික දර්ශන සහ වර්ණවත් ජාතික සංස්කෘතිය හයිනැන් පළාත ආකර්ෂණීය සංචාරක ස්ථානයක් බවට පත් කර තිබෙනවා.

මෑත වසර කිහිපයකදී සම්පත්වලින් උපරිම වාසිදායකත්වයක් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර සංචාරක දූපත යන සංවර්ධන උපාය මාර්ගය ඔස්සේ හයිනැන් පලාත කැපී පෙනෙන ජයග්‍රහණයන් අත්කර ගැනීමට සමත් වුණා. හයිනැන් පලාත් සංචාරක සංවර්ධන කොමිසමේ උප අධ්‍යක්ෂ sun ying මහත්මිය චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය අමතමින් මෙසේ පැවසුවා.

"ජාත්‍යන්තර සංචාරක දූපත නැමැති සංවර්ධන ක්‍රමෝපායට, වසර 2009යේ දෙසැම්බර මාසයේ රාජ්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණේ. පසුව මේ වන විට වසර 2කට වැඩි කාලයක් තුළ ඊට අදාළ ප්‍රතිපත්ති රැසක් ඉදිරිපත් කෙරුණා. ඒවා ක්‍රියාවට නැංවී තිබෙනවා. එම ප්‍රතිපත්ති මඟින් හයිනැන් දූපතට වැදගත් බලපෑම් සිදු වෙලා තියෙනවා. ජාත්‍යන්තර සංචාරක දූපතක් වශයෙන් සංවර්ධනය කිරීමේදී සැබෑ ආර්ථයෙන් යුත් විශේෂ සංචාරක කලාපයක් බවට හයිනැන් පලාත පත් ව තිබෙනවා. එම ප්‍රතිපත්ති නිසා ජාත්‍යන්තර සංචාරක දූපත් සංවර්ධනය, වඩාත් ජාත්‍යන්තරකරණයට හා වඩාත් විධිමත්භාවය එක්ව තිබෙනවා.

චීන මධ්‍යම රජය ඉදිරිපත් කළ යහපත් ප්‍රතිපත්ති වලින් හයිනැන් දූපත් සංවර්ධනයට ඉහළ සහයෝගයක් හා ශක්තියක් ලැබී තිබෙනවා. තීරු බදු අහෝසි කිරීමේ ප්‍රතිපත්තිය එහි ස්වර්ණමය අවස්ථාවයි. මේ වන විට තීරු බදු රහිත වෙළඳ සාප්පු හයිනැන් පලාතේ හයිකෝ හා සැන්යා නගරවල ස්ථාපිත කර අවසන්. සංචාරකයන් විශාල පිරිසක් ඉන් ආකර්ෂණය කර ගෙන තිබෙනවා. සැන් යා නගරයේ පිහිටි තීරු බදු රහිත වෙළඳ සාප්පුවලදී විවිධ සුවඳ විලවුන්, ආභරණ, ඔරලෝසු, හම් නිෂ්පාදිත ආදී විසි දහසකට වැඩි වෙළඳ භාණ්ඩ දැකිය හැකියි. එම වෙළඳ භාණ්ඩ මිල සාමාන්‍යයෙන් දේශීය වෙළඳ පොළට වඩා සියයට 15කින් හෝ 35කින් පමණ අඩුයි.

සැන් යා තීරු බදු රහිත වෙළඳ සාප්පු උප අධ්‍යක්ෂ guan wu ඒ පිළිබඳව අදහස් දැක් වූයේ මෙලෙසයි.

"තීරු බදු රහිත වෙළඳ සාප්පු හයිනැන් දූපත් සංචාරක ආර්ථික සංවර්ධනයට ඉතා වැදගත් දිරි ගැන්වීමක්. කළින් නම් හයිනැන් පිළිබඳ තිබුණේ S අකුරු තුනක්. ඒ කියන්නේ sunshine, sea, sandbeach කියලා. දැන් තවත් S එකක් වැඩි වෙලා තියෙනවා. Shopping. තීරු බදු අහෝසි කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියත්මක වීමට පෙර සාප්පුසවාරි සඳහා හයිනැන්හි ඒක පුද්ගල සංචාරක ආදායම යුවාන් සීයයක් පමණයි. තීරු බදු රහිත වෙළඳ සාප්පුව විවෘත වීමෙන් පසු පසුගිය වසරේ සංඛ්‍යාලේඛනවලට අනුව එම ප්‍රමාණය යුවාන් දෙසීයය ඉක්මවා ගොස් තියෙනවා."

ප්‍රතිපත්ති නිදහස හයිනැන් ජාත්‍යන්තර සංචාරක දූපත් ක්‍රමෝපායීය සංවර්ධනයට විශාල සහයක් ලබා දී තිබෙනවා. ඒ පමණක් නොවෙයි. පොහොසත් සංචාරක සම්පත් වලින් සුන්දර සංචාරක ස්ථාන රැසක් සංවර්ධනය කිරීමට හයිනැන් පලාත සමත් වුණා. උදාහරනයක්

හැටියට, ලෝකයේ සුන්දර ම මුහුදු බොක්ක වන යාලුං බොක්ක, ක්ෂතිජය සහ පසැහිලි කන්ද ඇතුළු දර්ශණීය ස්ථාන රැසක් එහිදී දැක ගත හැක.

සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා හයිනැන් පළාත මෙම කර්මාන්තයේ නිරතව සිටින සේවකයන්ගේ සේවා ප්‍රමිතිය පිළිබඳව දැඩි අවධානයක් යොමු කොට එහි සේවකයන්ගේ වෘත්තීය කුසලතා ද ශක්තිමත් කර තිබෙනවා. පසුගිය වසරේ හයි නැන් පළාත, ගම්මාන සංචාරය, මුහුදු සංචාරය, ගොල්ෆ් සංචාරය,හෝටල් සහ සංචාරක කලාප යනාදී ක්ෂේත්‍ර වල සේවය කරමින් සිටින කාර්ය මණ්ඩල වෙනුවෙන් පුහුණු පන්ති 08ක් සංවිධාන කළා.එහි සියලු සේවකයන්ගෙන් සියයට 90.7ක පිරිසක් ඊට සම්බන්ධ වී තිබෙනවා.

සැන්යා හි යා ලුං බොක්ක ආශ්‍රිතව පිහිටි සංචාරක ගම්මානයක සේවිකාවක් වන ලී මහත්මිය, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියට මේ ගැන ප්‍රකාශ කළා.

“මම හිතන්නේ මෑත වසර කිහිපයකදී හයිනැන්හි සංචාරක සේවකයන් කළින්ට වඩා ඔවුන්ගේ චින්තන හා සේවා හැකියා මහා පරිමාණයෙන් වර්ධනය කර ගෙන තියෙනවා. විශේෂයෙන් ම භාෂා හැකියා දියුණු වෙලා තියෙනවා.

හයිනැන් පළාත සුවිශේෂ සාගර දූපත් ස්වරූපය නිසා දිනෙන් දින ම වැඩි දෙස් විදෙස් සංචාරකයන් ආකර්ෂණය කර ගෙන තිබෙනවා. සංඛ්‍යාලේඛනවලට අනුව පසුගිය වසරේ හයි නැන් පළාතට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 30 ඉක්මවා ගොස් තිබෙනවා. එහි සංචාරක ආදායම් යුවාන් බිලියන 32.2ක්.

චීනයට පැමිණීම විශේෂයෙන් ම උෂ්ණ කලාපයේ පිහිටි හයිනැන් පළාතේ සංචාරය කිරීම තමාගේ දැඩි ආශාවක්ව තිබූ බව රුසියානු සංචාරකයෙකු වන Vladimir ප්‍රකාශ කළා.

“චීනයට දිගුකාලීන ඉතිහාසයක් තියෙනවා. චීනයට පැමිණෙන්න මම හරිම කැමතියි. ඇයි මා හයිනැන් දූපත තොරා ගන්නේ. මෙහි වැලි වෙරළක් තියෙනවා. රුසියාව හා සැසඳීමේදි හරිම

උණුසුම්.අනිත් එක, මෙහි මුහුදු දර්ශනය ද හරිම සුන්දරයි. වාතාශ්‍රය ඉතා පිරිසිදුයි.

වසර 2020 වන විට, හයිනැන් හි සංචාරක සේවා පහසුකම්, කළමනාකරණ හා සේවා මට්ටම ද ජාත්‍යන්තර සංචාරක සේවා ප්‍රමිතිය හා සමගාමී මට්ටමකට ගෙන ඒමට හැකි වනු ඇතැයි වාර්තා වෙනවා. ඒ වන විට, ලෝකයේ ඉහළ මට්ටමක පවතින සාගර දූපත් සංචාරක ස්ථානයක් විදිහට හයිනැන් පළාත සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි. මුළු ලෝකය වෙත විවෘත වන හයි නැන් පළාත දෙස් විදෙස් සංචාරයකයන්ගේ දැඩි ආකර්ෂණයට ලක් වෙමින් තිබෙනවා.

හරිත සුගත ජාත්‍යන්තර දූපතක් ගොඩනැගීම

දකුණු චීනයේ පිහිටා තියෙන හයි නැන් දූපත, චීනයේ එකම නිවර්තන සාගර දූපතයි. එහි තියෙන සරුසාර සංචාරක සම්පත් සහ මනා ජෛව පරිසරය, දෙස් විදෙස් සංචාරකයන්ගේ සිත් ඇද ගෙන තියෙනවා. වසර 1999යේ, හයි නැන් පළාත, ජෛව පරිසරය යන ආකල්පය මුල් කර සංවර්ධනය කිරීම පටන් ගත්තා. ඒ අනුව, හයි නැන් පළාත, චීනයේ ජෛව සංරක්ෂණයෙන් ආර්ථිකය වර්ධනය කිරීමට යොමු කළ පළමු පළාත බවට පත් වුණා.

හයිනැන් පළාතේ වනාන්තර සම්පත සහ සාගර සම්පත එම පළාතේ සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමේ වැදගත්ම මෙවලම් දෙක ලෙස සැලකෙනවා. ඒවා, හරිත සංචාරය සහ නීල සංචාරය ලෙස හැඳින් වෙනවා. එමෙන්ම, එහි යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය එසේ ජෛවාකාරයෙන්, සංචාරක සම්පත මනා ලෙස ප්‍රයෝජනයට ගෙන සංවර්ධනය කර ඇති උද්‍යානයක්.

යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය පිහිටා තියෙන්නේ හයි නැන් පළාතේ සුප්‍රකට සැන් යා නගරයේ. සැන් යා නගරය කියන්නේ ‘Miss World’ තරඟය කිහිප වතාක් පවත්වා තියෙන සුන්දර නගරයක්. එහි යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානයේ බිම්සරිය හෙක්ටාර 1506ක්. සංචාරයකයන්ට එහි සොඳුරු නිවර්තන වන දර්ශනය රස විඳින්න පුළුවන් වෙනවා විතරක් නෙවෙයි, ඔවුන්ට එහිදී නිවාඩු කාලය සතුටින් ගත කරන්නත් පුළුවන්.

යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානයේ මුහුදු , වනාන්තරය මෙන්ම, කඳුකරයත් තියෙන නිසා, එය චීන සුප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂක ෆෑං සියාඕ ගාංගේ ආකර්ෂණය ඇද ගත්තා. එතකොට, ඔහු සිය If you are the one, 2 නමැති චිත්‍රපටයේ පසුබිම් රූ තලය ලෙස යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය තෝරා ගත්තා. එම චිත්‍රපටය චීනය පුරා තිර ගත වීමත් සමගම, යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය, උණුසුම් සංචාරක ගමනාත්තයක් බවට පත් වෙලා තියෙනවා.

එම උද්‍යානයේ උප අධ්‍යක්ෂ ජනරාල්, ෆෝ සැන් ලයි මහතා, තම උද්‍යානයේ සුවිශේෂ ලක්ෂණ ගැන විස්තර කරමින්, මෙහෙම කිව්වා:

‘කලින් හයිනන් දූපතේ සංචාරක ආකර්ෂණීය ස්ථාන ඔක්කෝම මුහුදට සම්බන්ධ ඒවා වුණා. පසුව අපි මේ උද්‍යානයේ කඳුකර සම්පත වැඩියෙන් ගවේෂණය කරන්න සමත්

වුණා.වනාන්තරයේ සතුන්, දුර්ලභ උද්භිද වර්ග,අමුතු ගල්, ගංගා, ඒ සියල්ලම හොඳ සංචාරක සම්පත් ලෙස අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන්. '

යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය වසර 2009යේ සැප්තැම්බර මාසයේ විවෘත වුණා. එය ඉදි කිරීමේදී, ජෛව පරිසර සුරැකුමට විශේෂ අවධානයක් යොමු වුණා. කඳුකරයේදී මාර්ග ඉදි කරන විට, ලස්සණ හෝ පරණ ගස් හමු වෙනවා. බොහෝ අපූරු හැඩවලට තියෙන ගල් ද හමු වෙනවා. ඒ වැනි අවස්ථාවලදී, එහි ව්‍යාපෘති භාර අය තාවකාලිකව ඉදි කිරීම් සැළැසුම් සකස් කරන්න කටයුතු කළා. ඒ සඳහා ඉදි කිරීම් පිරිවැය ගොඩාක් වැඩි වුණා. හැබැයි දැන් මේ උද්‍යානයේ ඇවිදින විට, කඳුකරය තරණය කරන විට, සංචාරකයන්ට අනපේක්ෂිත සතුටක් නොකඩවාම ලැබෙනවා.

මේ ගැන නෝ සැන් ලයි මහතා තවදුටරත් මෙසේ කිව්වා:

'අපි වන සුරැකුම් කණ්ඩායමක් ස්ථාපිත කළා. හිතාමතාම ගස් කැපුම අපි තහනම් කළා. දඩයම් කිරීමත් තහනම් වුණා. මෙතනින් ගල් ගෙන යාම, වගා කටයුතු සිදු කිරීම, දර කැපුම, සියල්ලම තහනම් කර තියෙනවා.'

යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානයේ ගොඩනැගිලි ඔක්කෝම එක් මහල් හෝ දෙමහල් විලා. ගල්, ගස් පොතු, වියළි තණකොළ වැනි ස්වභාවික අමුද්‍රව්‍යවලින්, ඒ විලා ලස්සණට, පරිසරයට ගැළපෙන සේ සැරසී තියෙනවා. හයි නන් දූපතේ ආවේණික සුළු ජාතිකයක් වන ලී ජාතිය සහ ම්‍යාඕ ජාතිය යන ජන වර්ග දෙකේ ජන නිවාස ශෛලියෙන් ඒවා ඉදි කර තියෙනවා. ඇතට පෙනෙන්නේ මේ ගොඩනැගිලිවලට කකුල් තියෙනවා වාගේ. ඒ නිසා මෙහි වෘක්ෂලතා හොඳින් ආරක්ෂා කර තියෙනවා. සූර්ය බලශක්තිය වැනි අවකාබන් තාක්ෂණයත් වැඩියෙන් භාවිත කෙරෙනවා. දූෂිත ජලය පවිත්‍ර කොට යළි වාරි මාර්ග සංවර්ධනයට

යොදනවා. කසල පාලනය කිරීමටත් පියවර ගෙන තියෙනවා. මේ ගැන විස්තර කළ නෝ සැන් ලයි මහතා:

'සංචාරකයන්ගේ ගණන වැඩි වීමත් සමගම, කසල වැඩි වීමත් ප්‍රශ්නයක්. අපි කසල එකතු කරන මෝටර් රථ හඳුවා දුන්නා. ඒ කසල එකතු කරන මෝටර් රථ, හැමදාම නියමිත වේලාවට, නියමිත තැන්වලට ගිහිල්ලා කසල එකතු කරනවා. ඊට පස්සේ ඒ කසල කඳුකරයේ මුලට ප්‍රවාහනය කරලා පාලනය කරනවා. අවජල පාලනය කරන්නට, අපි දූෂණ ජල පාලන කම්හල් 7ක් ස්ථාපිත කළා. දූෂණ ජලය ප්‍රතිචක්‍රියකරණයෙන් පසු, යළි වනාන්තරයේ වාරි මාර්ගවලට එකතු කරනවා. එතකොට අපේ උද්‍යානයේ මනා ජල සංසරණ පද්ධතියක් ගොඩනගා තියෙනවා.'

යා ලොං බොක්කේ නිවර්තන වනාන්තර උද්‍යානය දැන් එන්න එන්න දෙස් විදෙස් සංචාරකයන්ගේ වැඩි ඇල්මකට ලක් වී තිබෙනවා. එය හයි නැන් දූපතේ සංචාරක ලාංජනයක් බවට පත් වෙලා තියෙනවා. හරිත සුසංගත ජාත්‍යන්තර දූපතක් ගොඩනැගීම හයි නැන් පළාතේ සංවර්ධන ඉලක්කයක්. ඉතින් හයි නැන් පළාතේ මේ ඉලක්කය නොබෝ කලකින් ඉටු කළ හැකි යැයි විශ්වාස කෙරෙනවා.

හයිනැන් දිවයිනේ විශේෂිත සාම්ප්‍රදායික සංස්කෘතිය

දකුණු චීන මුහුදේ පිහිටි හයිනැන් දිවයින තායිවානයට පසු චීනය සතු දෙවැනි විශාලතම දූපතයි. සදාහරිත බව සහ නා නා විධ මල් වර්ග වසරේ සෑම කාලයකම දැකිය හැකි වීම එහි විශේෂයක්. වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 24යි.උෂ්ණත්වය ඉහළම මට්ටමක පවතින ජූලි මාසයේ වුවද එය සියයට 24.8කට වඩා වැඩි වන්නේ නැහැ.සිසිල් සාගර ජලය පිසළන මඳ පවනට පින්සිදු වන්නට සංචාරකයන්ට උෂ්ණත්වයක් දැනෙන්නේම නැහැ. සීතකාලය සෞම්‍යයි. අවම උෂ්ණත්වය ඇති ජනවාරි මාසයේදී පවා සාමාන්‍ය සෙන්ටිග්‍රේඩ් අංශක 17.2යි.එපමණක් නොව, හයි නැන් දිවයින පිරිසිදු වාතයෙන් පරිපූර්ණයි.පැහැදිලි හිරු එළිය නිරන්තරයෙන් ම පවතින්නේ. නිල්වන් සාගර දියදහර, ධවල වෙරළ තීරය, සුන්දර දසුනෙන් යුත් පොල් රුප්පා, රමණීය පරිසර පද්ධතිය, මේ චිත්තාකර්ශනීය වටපිටාව වසරේ සෑම කාලයක ම සහතික කළ හැකියි. සරුසාර සංචාරක සම්පත් හිමි වීමේ හේතුවෙන් හයි නැන් දිවයිනේ සංචාරක කර්මාන්තය අධි වේගයෙන් වර්ධනය වෙමින් පවතිනවා. මෑත වසර කිහිපයක් තුළ ස්වාභාවික සම්පත් සහ සාම්ප්‍රදායික සංස්කෘතිය එකට එකතු කිරීම කෙරෙහි එම දිවයින අවධානය යොමු කරනවා.

චීනයේ ලී සහ මියෝ සුළු ජනකොට්ඨාසවල පැරණි ජනප්‍රවාද, අතිසියුම් අත්කම් කලාව සහ මිහිරි ජනගීත සියල්ලම ඒක්තැන්වුන කලා සංදර්ශන මෙහි පැවැත් වෙනවා. හයිනැන් ජනතාවට ආවේනික සංස්කෘතීන් සහ සිරිත් විරිත් සම්බන්ධයෙන් සංචාරකයන්ට මනා අවබෝධයක් එහිදී ලබා ගන්නට පුළුවන්. ලී, මියෝ, හුයි වැනි සුළුතර වාර්ගික ජනකොට්ඨාස ගණනාවක් ම එහි විසීම ඊට හේතුවයි. එම ජාතීන්ට විශේෂිත වූ විශිෂ්ට සිරිත් විරිත් පිළිබඳව හොඳ අධ්‍යයනයකට ද ඉඩ සලසා ගැනීමේ හැකියාව පවතින්නේ ඒ ඒ සුළු ජාතික ගම්මානවලට පහසුවෙන් යා හැකි වීම හේතුවෙන්. Bin Lang Guඑවැනි ගම්මානවලින් එකක්. හයි නැන් පළාතේ සංචාර ප්‍රවර්ධන කොමිසමේ උප අධ්‍යක්ෂ Sun Yingමහත්මිය එම ගම්මානය ගැන මේ ලෙස විස්තර කළා:

"Bin Lang Guනමැති ගම්මානය ඇත්ත වශයෙන්ම සංචාරක ගමනාන්තයක්.කලින් එය ලී ජාතික ගම්මානයක්. පස්සේ අපි එහි කෞතුකාගාරයක් ඉදි කළා.ඒවගේ ම අපි විවිධාකාර ලී ජාතික සංදර්ශන ඉදිරිපත් කරනවා.ඒ අතර ලී ජාතික කතාන්දරය නැමැති සංදර්ශනයක් චීනය පුරා ම සම්මාන 11ක් දිනා ගෙන තිබෙනවා.එම ගම්මානයෙන් ඔබට ලී ජාතික සංස්කෘතිය ගැන මනා ලෙස අවබෝධ කර ගන්න පුළුවන් කියලයි මා විශ්වාස කරන්නේ."

Bin Lang Gu ගම්මානය චීන ජාතික මට්ටමේ A හතරක් සහිත ජෛව සංස්කෘතික හා

සංචාරක කලාපයක්.එම කලාපය දෙපස හරිත වනාන්තර සරුසරුවට වැවෙනවා.එම කලාපයේ බුලත් විශාල ප්‍රමාණයක් වැවෙන නිසා එයBin Lang Gu යන නමින් නම් කරනු ලැබ තිබෙනවා.චීන භාෂාවෙන් Bin Lang කියන්නේ බුලත්. ලී ජාතික සාම්ප්‍රදායික සංස්කෘතියේදී බුලත් වැදගත් වන චාරිත්‍ර හා සම්බන්ධ වෙනවා. එවගේ ම එය ද ලී ජාතිකයන්ගේ ජීවන ක්‍රමයේ සංකේතයක් ලෙස සැලකෙනවා. ලී ජාතික වැදගත් උත්සවවලදී සහ විවාහ මංගල්‍යවලදී බුලත් භාවිත කෙරෙනවා.එහි මාර්ගෝපදේශිකා A Mei ඒ ගැන මෙසේ කථා කළා:

“ලී ජාතිකයන්ගේ වැදගත් ම උත්සවය විවාහ මංගල්‍ය උත්සවයයි. නව අවුරුදු උත්සවය නොවෙයි.මනමාලයා මනමාලියගේ ගෙදර යන කොට බුලත් රැගෙන යන්න ඕන. මනමාලයා බුලත් වැල් 49කට නැගලා බුලත් කොල 49ක් ලබා ගෙන මනමාලියට තෑගි කරන්න ඕන.”

හයිනැන් පලාතේ පුරාණතම පදිංචිකරුවන් ලී ජාතිකයන් වෙනවා. ඔවුහු හයිනැන් පළාතේ පදිංචිව සිටීමේ ඉතිහාසය වසර දස දහසක් ඉක්මවී තිබෙනවා. මෙතරම් දිග කාලයක් තුළ ලී ජාතිකයෝ තමන්ට අයත් විශේෂ සංස්කෘතියක් බිහි කර තිබෙනවා. පුරාණ ගෝත්‍ර චින්නය, අතිසියුම් ඇඳුම් පැළඳුම් සහ අපූරු නැටුම් හා සංගීත භාණ්ඩ සංදර්ශන සියල්ල ම සංචාරකයන්ගේ නෙත් සිත් ඇද බැඳ ගන්නවා. හූ ජියැන් පළාතේ සංචාරක මාර්ගඋපදේශක Dong මහත්මිය ඒ ගැන සඳහන් කරමින් මෙසේ පැවසුවා:

“අප හූ ජියැන් පලාතේ සුළු ජාතික සිරිත් විරිත් ඉතා අඩුයි. මොකද එහි වාසය කරන සුළු ජාතින් අඩු නිසා. හැබැයි හයි නැන් පළාත මෙන් ම අප හූ ජියැන් පළාත ද වෙරළාසන්න ස්ථානයක්. කලින් මෙතරම් දැඩි සුළු ජාතික ජනශ්‍රැති දැකලා නැති නිසා මම එයට දැඩි රුචියක් දක්වනවා.”

සුළු ජාතික ගම්මාන බිහි වීම එම පළාතේ එක් වැදගත් ජයග්‍රහණයක්. එහි අවසන් ඵලය හයිනැන් දිවයින චීනයේ යහපත් හා ගුණාත්මක නිවාඩු නිකේතනයක් ලෙස ප්‍රසිද්ධියට පත් වීමයි. චීනයේ එකම නිවර්තන දිවයිනත් එයයි. දිවයිනේ නැගෙනහිර වෙරළ තීරයේ උතුරෙන් අගනගරය වන හයිකුසිට දකුණේ සන්යා තෙක් නානා ප්‍රකාර වූ වෙරළ තීරයන්ගෙන් මෙම නිවාඩු නිකේතනය සමන්විතයි. චීනයේ සාගර භූමි ප්‍රදේශයෙන් තුනෙන් දෙකක් ම අයත් වන්නෙත් මේ දිවයිනට ම

වීම සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනයෙහිලා සුවිශේෂී වැදගත්කමක් හිමිවන්නක්. හැයිනැන් පළාතේ සුන්දර ස්වාභාවික පරිසරය සහ සුළු ජාතික වාතාවරණය අප්‍රමාණ සංචාරකයන් ආකර්ෂනයක් ලභා කර ගෙන තිබෙනවා. එපමණක් නොවෙයි, බොහෝ විදේශ ජනමාධ්‍යයන්ගේ අවධානයට ලක් ව තිබෙනවා.දකුණු කොරියාව, රුසියාව සහ ජර්මනිය ඇතුළු රටවල ජනමාධ්‍ය Bin Lang Gu ගම්මානයට පැමිණ පටිගත කිරීමේ සහ නිරීක්ෂණ කිරීමේ කටයුතුවල යෙදුණා. එම ගම්මානයේ Lei Qiang නමැති කළමනාකරුවෙක් මෙසේ විස්තර කළා:

“දකුණු කොරියාවේ KBS රූපවාහිනී සේවය නිරන්තරයෙන් ම මෙහි පැමිණ, විශේෂ ආහාර, ඇඳුම් පැළඳුම්, නර්තන සහ සංගීත භාණ්ඩ පිළිබඳ වැඩසටහන් පටිගත කරනවා.එම වැඩසටහනෙන් ඒ රට පුරා අප Bin Lang Gu ගම්මානය අංග සම්පූර්ණයෙන් ප්‍රචාරය කර තියෙනවා.”

හයිනැන් පළාතේ ආදිවාසීන්——ලී ජාතිය

හයිනැන් පළාත පිහිටි ඇත්තේ චීනයේ දකුණු ප්‍රදේශයේ. නිවර්තන දූපතක් වන මෙය ලෝකප්‍රසිද්ධ ආකර්ෂණීය ස්ථානයක්. එමෙන් ම, විවිධ සුළු ජාතික සංස්කෘතිකාංග එහි සංචාරක කර්මාන්තයේ වැදගත් අංගයන් බවට පත් වී තිබෙනවා. හන් ජාතිය, ලී ජාතිය, මියෙෆ ජාතිය, හුයි ජාතිය ඇතුළු ජාතීන් 20කට වැඩි සංඛ්‍යාවක් එහි දකින්න පුළුවන්. ඒ අතරින්, සුවිශේෂී ලක්ෂණවලින් හෙබි සුළු ජාතීන් දෙකක් ලෙස ලී ජාතිය සහ මියෙෆ ජාතිය හඳුන්වා දිය හැකියි.

ලී ජාතිය හයිනැන් පළාතේ ආදිවාසීන්. ඔවුන් පාරම්පරික ව හයිනැන් දූපතේ මධ්‍යම හා බටහිර ප්‍රදේශවල නිවර්තන වනාන්තරවල ජීවත් වෙනවා. තවමත්, ඔවුන් ඔවුන්ට ආවේනික සුවිශේෂී ජන ලක්ෂණ පවත්වා ගෙන යනවා. අපිත් එක්ක හයිනැන් පළාතේ සැන් යා නගරයේ පිහිටි ලී ජාතික ගම්මානයකට ගොස් එහි සුවිශේෂී ගෙත්තම් කලාව පිළිබඳව දැන ගන්න ඔබට පුළුවන්.

ලී ජාතික ගම්මානයට යන අපට මුලින් ම දැක ගන්න ලැබෙන්නේ එහි වැසියන් ඔවුන්ට ආවේනික ගීත ගායනා කරමින් අමුත්තන්ව සාදරයෙන් පිළි ගන්නා අන්දම.

ලී ජාතියේ සුවිශේෂී ගෙත්තම් කලා සංස්කෘතිය පිළිබඳව දැන ගැනීම අපේ බලාපොරොත්තුව. ඔබ දන්නවා ද ලී ජාතියේ මේ සුවිශේෂී ගෙත්තම් කලාවට වසර 3000කට වැඩි ඉතිහාසයක් තිබෙනවා කියලා? ලී ජාතික ගෙත්තම් කලාව චීන රෙදිපිළි ඉතිහාසයේ ජීවමාන ෆොසිලයක් වශයෙන් හැඳින්වෙනවා.

ලී ජාතිකයන්ගේ සුන්දර ගම්මානයේදී, අපිට හමු වුණා මිත්තනියක්. ඇගේ නම හූ යා ලැන්. ඇගේ වයස අවුරුදු අසූවයි. නමුත්, ගෙත්තම් කරන විට, ඇය ඇයගේ දස්කම් හොඳට ඉස්මතු කර පෙන්නුවා. ඇය අපිට සඳහන් කළා කොයි කාලයේ ඉඳන් ද ගෙත්තම් කරන්න පටන් ගත්තේ කියලා ඇයටත් හරියට මතක නැහැ. වයස අවුරුදු දහයේ පමණ ඉඳලා වගේ ඉගෙන ගන්න පටන් ගත්තා. ඒ කාලයේ, ඇයට ගෙත්තම් කරන්න කියලා දෙන්න කෙනෙක් හිටියේ නැහැ. ගමේ වැඩිහිටියන් ගෙත්තම් කරන කොට ඇය ඒ දිහා බලා ඉන්නවා. ටිකින් ටික තමයි ඒ විදිහට තමයි ගෙත්තම් කරන්න ඉගෙන ගත්තේ කියලා ඇය අපිට කිව්වා.

ලී ජාතියේ ගෙත්තම් කලාව තුළ ලී ජාතික කාන්තාවන්ගේ දස්කම් සහ හැකියාවන් හොඳින් එකට එකතු කර තිබෙනවා. ලී ජාතික වං යා, හයිනැන් පළාතේ ලී ගෙත්තම් කලා කෞතුකාගාරයේ මහ පෙන්වන්නියක්. ලී ගෙත්තම් කලාව පිළිබඳව ඇය අපිට කිව්වා ලී ජාතිකයන් මේ ගෙත්තම් සාදන්නේ කපු වර්ගවලින් කියලා. වසර 3000කට පෙර හයිනැන් දූපතේ කපු තිබුණා. ඉන් අනතුරුව, ලී ජාතික ගෙත්තම් ඇති වුණා කියලාත් ඇය සඳහන් කළා.

ලී ජාතික ගෙත්තම් ජනප්‍රිය කලාවක්. හොඳට ගෙත්තම් කරන්න කැමති නම්, කාර්යන් 4ක් කළ යුතුයි. ප්‍රථමයෙන් ම, නූල් සැකසීම සිදු කරනවා. ඊළඟට, සායම් කිරීම, එහිදී ස්වභාවික ද්‍රව්‍ය තින්ත හැටියට භාවිත කරනවා. තුන්වන කාර්ය ලෙස හඳුන්වන්නේ විවීම නැත්නම් ගෙතීම. මෙය වැදගත් ම කාර්ය ලෙස හඳුන්වා දෙන්න පුළුවන්.

අවසාන කාර්ය තමයි ගෙත්තම් කිරීම. ලී ජාතීන්ගේ භාෂාවට අක්ෂර මාලාවක් නැහැ. ලී ජාතිකයන් ගෙත්තම් කරන විට, සැළැස්මක් නැතුව, තමන් ඇසූ දුටු දේ සිතුවම් ලෙස කෙලින් ම නිර්මාණය කරනවා. ඒ නිසා, අපිට කියන්න පුළුවන් ලී ජාතික ගෙත්තම් ලී ජාතියේ විශිෂ්ඨ මහා වංශය කියලා.

කෙසේවෙතත්, කාලය ගත වීමත් සමඟ, ලී ජාතියේ ආවේනික ජීවන රටාවලට වර්තමාන සංස්කෘතියෙන් බලපෑම් එල්ල වුණා. මේ ලී ජාතික ගෙත්තම්වල නිරත වන පාරම්පරික ශිල්පීන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ම අඩු වෙලා තිබෙනවා. ඒ නිසා, ලී ජාතික ගෙත්තම් කලාව උරුමයක් වශයෙන් තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යෑමේ අසීරුතා ඇති ව තිබෙනවා.

මේ ගෙත්තම් කලා සංරක්ෂණය සඳහා, මෑත වසර කිහිපය තුළ, චීන රජය වැඩපිළිවෙළ රැසක් ක්‍රියාත්මක කර තිබෙනවා. 2008 වසරේ, ලී ජාතීන්ගේ ඇඳුම් පැළඳුම් චීන ජාතික මට්ටමේ සංස්කෘතික උරුම ලයිස්තුවට එක් කෙරුණා.

දැන්, ලී ජාතික ගෙත්තම් සැකසීමේ ව්‍යාපාර රැසක් ඉස්මතු වෙලා තිබෙනවා. ගෙත්තම් පිළිබඳ හයිනැන් වින් ෂියු වර් බේ නමැති සීමාසහිත සමාගමත් ඊට ඇතුළත්. මේ සමාගමේ අධ්‍යක්ෂවරිය මීට පෙර රසායනික සහ කාර්මික ව්‍යාපරයක නිරත වෙලා සිටියා. බොහෝ ඉස්සර කාලයක හයිනැන් පළාතේ සංචාරය කරන විට, ඇයට ප්‍රථම වරට ලී ජාතික ගෙත්තම් දැක ගන්න ලැබුණා. එම ගෙත්තම් ඇගේ සිත තදින් ම ඇද ගත්තා. ඉන් අනතුරුව, ඇයට දැන ගන්න ලැබුණා ලී ජාතික ගෙත්තම් උරුමයක් වශයෙන් පවත්වා ගැනීමට නොහැකි තත්ත්වය පිළිබඳව. 2005 වසරේ, ඒ සමාගම ඇය ලියා පදිංචි කර ලී ජාතික ගෙත්තම් කලාව සංරක්ෂණය කරන්නට සැළසුම් කිරීමට පටන් ගත්තා. ලී ජාතික ගෙත්තම් කලාවේ පර්යේෂණය, තොරතුරු රැස් කිරීම, නිර්මානශීලි ව ගවේෂණය කිරීම ඇතුළු කරුණු ඒ සමාගමේ වැඩකටයුතුවලට ඇතුළත් වුණා. ඒ සමාගමේ විවිධාකාර ලී ජාතික ගෙත්තම් භාණ්ඩ අලෙවි කරනවා. බිත්තිවල රඳවන විශාල සැරසිලි, ඇඳ සැරසිලි, ලිපිද්‍රව්‍ය, ජංගම දුරකථනවල එල්ලන සැරසිලි හරි ම ජනප්‍රියයි. මේ වගේ මෝස්තර ලක්ෂණයන් සහිත ලී ජාතික ගෙත්තම් භාණ්ඩ දෙස්-විදෙස් සංචාරකයන් ආකර්ෂණය කර ගත්තා.

චීන රජයේ හා ජනතාවගේ පොදු උත්සාහය මත, 2009 වසරේ ඔක්තෝබර් මාසයේ, ලී ජාතියේ ආවේනික ගෙත්තම් ශිල්පය UNESCO සංවිධානය, හෙවත්, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනය, විද්‍යාව හා සංස්කෘතිය පිළිබඳ සංවිධානයේ හැකි ඉක්මනින් ම සංරක්ෂණය කළ යුතු ප්‍රමුඛතා සංස්කෘති උරුම ලයිස්තුවට එක් කළා. හයිනැන් පළාත ද මේ සංරක්ෂණ කටයුතු වෙනුවෙන් කාල සටහනක් සකසා තිබෙනවා. ඒ මඟින්, 2013 වසර අවසන් වීමට පෙර, කාර්යන් 5ක් ඉටු කිරීමට බලාපොරොත්තු වෙනවා. පාරම්පරික කලාකරුවන් පෝෂණය කිරීම, නිෂ්පාදන පදනම් ඉදි කිරීම, උරුම සංරක්ෂණ ප්‍රමිති සැකසීම ඊට ඇතුළත්.

ජනතාවගේ දැනුවත්භාවය හා රජයේ කැපවීම සහිත ව, ලී ජාතික ගෙත්තම් ශිල්පය නූතන සමාජය තුළින් හොඳින් ප්‍රචලිත කිරීමට හැකි වන අතර නොකඩවා ම මේ උරුමය පවත්වා ගැනීමට හැකි වෙනවා කියලා අපිට විශ්වාසයක් තිබෙනවා.

සංචාරක චීන භාෂා පාඩම් මාලාව
导游汉语教程

සංචාරක චීන භාෂාව
සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව

සංචාරක මාර්ගෝපදේශක වෘත්තියට පිවිසීමට අපේක්ෂා කරන අයට විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වන චීන භාෂා පාඩම් මාලාවක් මෙවර කලාපයේ සිට අකන්ඩවම පල කිරීමට අප සුදානම්.

මෙම පාඩම් මාලාව චීන බස හදාරන කවර කෙනෙකුට හෝ වැදගත් වන පරිදි සකස් කර තිබේ. මෙහි භාෂා කොටස් ඇතුලත් ගුවන් විදුලි වැඩසටහනට ඔබට චීන ජාත්‍යාන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඔස්සේ සහ sinhalese.cri.cn වෙබ් අඩවිය ඔස්සේ සවන් දිය හැකියි.

පළමුවන පාඩම

මුලින්ම පහත සඳහන් සංවාදය දෙස බලන්න.

අනුර: nǐ hǎo, wǒ shì dǎo yóu.
නි හාඕ, වෝ ෂී ඩාඕ යුයෝ.
ආයුබෝවන් මම සංචාරක මහපෙන්වන්නෙක්.

ෂෙ ලී: nǐ hǎo, wǒ shì lǎo shī.
නි හාඕ, වෝ ෂී ලාඕ ෂර්
ආයුබෝවන් මම ගුරුවරියක්.
tā shì shuí, Anura?
තා ෂී ෂුවේ, අනුර?
මෙයා කවුද අනුර?

අනුර: tā shì wǒ de péng yǒu, Nimal.
තා ෂී වෝ ත පං යො, නිමල්.
මෙයා මගේ යාලුවෙක් නිමල්.

ෂෙ ලී: nín hǎo, Nimal. wǒ shì xiǎo lì.
නින් හාඕ, නිමල්. වෝ ෂී ෂෙ ලී.
ආයුබෝවන්, නිමල්. මම ෂෙ ලී.

නිමල්: nín hǎo, lǎo shī.

නින් හාඕ, ලාඕ ෂර්
ආයුබෝවන්, ගුරුතුමිය.
rèn shi nǐwǒ hěn gāo xìng.
රෙන් ෂර් නි වෝ හෙන් ගාඕ ෂිං.
ඔබ හඳුනා ගැනීම ගැන මම හරි සතුටුයි.

ෂෞ ලී: rèn shi nǐ wǒ yě hěn gāo xìng
රෙන් ෂර් නි වෝ යැ හෙන් ගාඕ ෂිං
ඔබ හඳුනා ගන්න ලැබීම ගැන මටත් හරි සතුටුයි.

දැන් අපි නම සංවාදයේ චීන වදන් යලි සලකා බළමු.

你好nǐ hǎo --නි හාඕ--ආයුබෝවන්

您好nín hǎo--නින් හාඕ--ආයුබෝවන්(සැළකිය යුතු කෙනෙක් වෙනුවෙන්)

我wǒ-- වෝ --මම

是shì-- ෂී--උපසර්ගයකි

导游 dǎo yóu -- ඩාඕ යුයෝ -- මහපෙන්වන්නෙක්

老师lǎo shī--ලාඕ ෂර්--ගුරුවරයා/ගුරුවරිය

他tā--තා --මෙයා

谁shuí--ෂුවේ-- කවු ද

我的wǒ de--වෝ ත--මගේ

朋友péng yǒu -- පං යො--යාලුවා

认识rèn shi -- රෙන් ෂර් --හඳුනා ගැනීම

也yě-- යැ-- ...ද / ...ටත්

很hěn--හෙන්--හරිම/ඉතාම

高兴gāo xìng -- ගාඕ ෂිං --සතුට

දෙවන පාඩම

සංවාදයට යොමු වීමට පෙර පහත සඳහන් වචන සහ වචන කාන්ඩ පිලිබඳ අවධානය යොමු කරන්න.

请qǐng--චිං--කරුණාකර

问wèn--වුන්--අහනවා

先生xiān sheng--ෂියැන් ෂේං--මහතා

吗ma--මා--ද

是的shì de--ෂී ත--ඔව්

欢迎huān yíng--හුන් ඉං--සාදරයෙන් පිළි ගන්නවා

来到lái dào--ලෑ ඩාඕ --පැමිණෙනවා/ළඟා වෙනවා

斯里兰卡sī lǐ lán kǎ--ස් ලි ලන් කා--ශ්‍රී ලාංකා

人rén--රෙන්--ජනතාව/මිනිස්සු

对duì--ඩුවෙ--හරි/ඔව්

这zhè--ච--මේ

名片míng piàn--මිං පියැන්--නම් පත

谢谢xiè xiè--ෂයැ ෂයැ--ස්තුතියි

දැන් අපි සංවාදය කියවා බලමු.

අනුර: qǐng wèn，nín shì wáng píng，wáng xiān shēng ma？
චිං වුන් , නින් ෂී වං පිං , වං ෂියැන් ෂේං මා?
කරුණාකර අහන්න, ඔබතුමා වං පිං, වං මහතා ද?

වං මහතා: shì de，wǒ shì wáng píng。
ෂී ත, වෝ ෂී වං පිං.
ඔව්, මම වං පිං.

nǐ shì dǎo yóu ma？
නි ෂී ඩාඕ යුයෝ මා?
ඔබ සංචාරක මහපෙන්වන්නෙක් ද?

අනුර: duì，wǒ shì nǐ de dǎo yóu，wǒ shì anura。
ඩුවෙ, වෝ ෂී නි ත ඩාඕ යුයෝ, වෝ ෂී අනුර.
ඔව්, මම ඔබේ සංචාර මහපෙන්වන්නා තමයි. මම අනුර.

wǒ shì sī lǐ lán kǎ rén。
වෝ ෂී ස් ලි ලන් කා රෙන්.
මම ශ්‍රී ලාංකාවේ කෙනෙක්.

වං මහතා: hěn gāo xìng rèn shi nǐ.
හෙන් ගාඕ ෂිං රෙන් ෂර් නි.
ඔබ හඳුනා ගැනීම මට සතුටක්.

අනුර: huān yíng lái dào sī lǐ lán kǎ。
හුන් ඉං ලෑ ඩාඕ ස් ලි ලන් කා.
ශ්‍රී ලාංකාවට සාදරයෙන් පිළි ගන්නවා.

zhè shì wǒ de míng piàn。
ච ෂී වෝ ත මිං පියැන්.
මේ මගේ කාඩ් එක.

වං මහතා: xiè xiè。
ෂයැ ෂයැ.
ස්තුතියි.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

අපි දැන්

97.9FM

නවතම තරංග මාලාවෙන් හැමදාමත්

ඔබ සමග!